**විසි එක් වන සියවස සඳහා උසස් අධ්‍යාපන ව්‍යාපෘතිය - 2016 ජනවාරි 01 දින සිට ඔක්තෝබර් 25**

---

විසි එක් වන සියවස සඳහා උසස් අධ්‍යාපන ව්‍යාපෘතියේ 2016 ජනවාරි 01 දින සිට ඔක්තෝබර් 25 දින දක්වා කාල පරිච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2010 අගෝස්තු 26 දින එළඹි අංක 4686 - එල්කේ දරන ණය ගිවිසුමේ 2 ආ (3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු , අරමුදල් යෙදවීම සහ ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, එවකට උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වර්තමානයේ උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. සාධාරණ සමාජයීය හා ආර්ථික සංවර්ධන අවශ්‍යතා අරමුණු කරගත් ගුණාත්මක උසස් අධ්‍යාපන සේවා බෙදා හැරීම පිණිස ග්‍රාහකයාගේ උසස් අධ්‍යාපන පද්ධතිය, ආයතනයන් හා මානව සම්පත්වල ධාරිතාවය ඉහළ නැංවීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 4,930 කට සමාන එජඩො මිලියන 40 ක් වූ අතර, ජාත්‍යන්තර සංවර්ධන සංගමය විසින් මුළු පිරිවැය සැපයීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2010 නොවැම්බර් 01 දින ආරම්භ කරන ලද අතර, 2015 දෙසැම්බර් 31 දිනට නිම කිරීමට සැලසුම් කර තිබුණි. පසුව ව්‍යාපෘති කාලපරිච්ඡේදය 2016 ඔක්තෝබර් 25 දක්වා දීර්ඝ කරන ලදී.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ

විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරිමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල, ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2016 ඔක්තෝබර් 25 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ලමබැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඊ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(උ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(ඌ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(එ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ

(ඒ) ණය ගිවිසුමෙහි දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 මතය**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මා දරන්නා වූ මතය වනුයේ,

(ඇ) 2016 ඔක්තෝබර් 25 දිනෙන් අවසන කාලපරිච්ඡේදය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2016 ඔක්තෝබර් 25 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2016 ඔක්තෝබර් 25 දිනට ශේෂය, එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ලං ම බැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) ණය ගිවිසුමෙහි දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඊ) ණය ගිවිසුමෙහි දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

**3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය**

**3.1 අරමුදල් උපයෝජනය**

මූල්‍යායනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ 2016 ඔක්තෝබර් 25 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| **ප්‍රභවය** | **ණයගිවිසුමේ මූල්‍යායනය සඳහා එකඟ වූ මුදල** | | **සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරිම** | **උපයෝජනය කළ අරමුදල්** | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ | | 2016 ඔක්තෝබර් 25 දක්වා | |
| | එජඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන |
| ජා සං සං | 40.00 | 4,930.06 | 600.00 | 3.90 | 517.70 | 36.90 | 4,830.53 |
| එකතුව | 40.00 | 4,930.06 | 600.00 | 3.90 | 517.70 | 36.90 | 4,830.53 |

ඉහත තොරතුරු අනුව, රු.මිලියන 4,930.06 කට සමාන එජඩො මිලියන 40 ක් වූ මුළු වෙන්කිරීමෙන් සියයට 92.25 ක් නියෝජනය වන රු.මිලියන 4,830.53 කට සමාන එජඩො මිලියන 36.90 ක් ව්‍යාපෘතිය විසින් කාල පරිච්ඡේදය අවසානයේදී උපයෝජනය කර තිබුණි.

**3.2 භෞතික ප්‍රගතිය**

**--------------------**

උසස් අධ්‍යාපන අංශය සඳහා වූ නියමයන් ආයතනගත කිරීම, ඉගැන්වීම හා ඉගෙනීම අදාළබව හා ගුණාත්මක බව ප්‍රවර්ධනය කිරීම, විකල්ප උසස් අධ්‍යාපනය ව්‍යාප්ත කිරීම හා ශක්තිමත් කිරීම සහ මානව සම්පත් සංවර්ධනය, නියාමනය, ඇගයීම, අධ්‍යයනය, සම්බන්ධීකරණය හා සන්නිවේදනය යන සංරචකයන් 04 ක් යටතේ ව්‍යාපෘතියේ කාර්යයන් ක්‍රියාත්මක කර තිබුණි. ව්‍යාපෘතියේ සමාලෝචිත කාල පරිච්ඡේදය අවසානයට ව්‍යාපෘති කාර්යයන් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ප්‍රගතිය පිළිබඳව පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) උසස් අධ්‍යාපන අංශය සඳහා නියමයන් ආයතනගත කිරීම සංරචකය යටතේ ජාතික සුදුසුකම් රාමුවක් හා තත්ත්ව සහතික පද්ධතියක් සංවර්ධනය කර උසස් අධ්‍යාපන අංශයේ ආයතන අතර සන්නිවේදනය කර තිබුණද, අදාළ පාර්ශවයන් විසින් එහි ඇතුළත් යෝජනා ප්‍රායෝගිකව ක්‍රියාත්මක කරන ලද බවට තහවුරු කරගැනීම සඳහා යාන්ත්‍රණයක් ස්ථාපිත කර නොතිබුණි.

(ආ) දෙහිවල පිහිටි උසස් තාක්ෂණික අධ්‍යාපනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයෙහි තත්ත්ව සංවර්ධන හා නායකත්ව මධ්‍යස්ථානය සඳහා ගොඩනැගිල්ලේ ඉදිකිරීම් වැඩ රු.මිලියන 80 ක ඇස්තමේන්තුගත පිරිවැයකට 2016 මැයි මාසයේදී නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වුවද, 2016 ජුනි 30 දිනට ඉදිකිරීම් වැඩ වලින් සියයට 60 ක් පමණක් නිම කර තිබූ අතර රු.මිලියන 61 ක මුදලක් එදිනට උපයෝජනය කිරීමට හැකි වී තිබුණි.

(ඇ) උසස් තාක්ෂණික අධ්‍යාපනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ හා ජාතික විශ්ව විද්‍යාල 15 ක අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් 240 දෙනෙකුගේ ආචාර්ය උපාධි හා පශ්චාත් උපාධි සඳහා අධ්‍යයනයන් සම්පූර්ණ කර ගැනීමට රු.මිලියන 366.86 ක මුදලක් ව්‍යාපෘතිය විසින් ලබා දී ඇති බව නිරීක්ෂණය විය. කෙසේ වුවද, ව්‍යාපෘති කාල පරිච්ඡේදය අවසානයේදී කාර්ය මණ්ඩල සාමාජිකයන් 30 දෙනෙකු ඔවුන්ගේ අධ්‍යයනයන් සම්පූර්ණ කර නොතිබූ බව නිරීක්ෂණය විය.

(ඈ) ව්‍යාපෘතිය විසින් 2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා උපාධි අපේක්ෂකයන් සඳහා පවත්වන ලද ඉංග්‍රීසි භාෂාව හා තොරතුරු තාක්ෂණ අධ්‍යයන වැඩසටහන් සමාලෝචිත කාල පරිච්ඡේදය සඳහා තවදුරටත් පවත්වා නොතිබූ බව නිරීක්ෂණය විය. අධ්‍යයන වැඩසටහන් පවත්වන කාල පරිච්ඡේදය තුළදී ඒ සඳහා රු.මිලියන 509 ක මුදලක් ව්‍යාපෘතිය විසින් වැය කර තිබුණි.

(ඉ) සබරගමුව විශ්ව විද්‍යාලයේ ව්‍යවහාර විද්‍යා පීඨයේ පිටත පුහුණු මධ්‍යස්ථානයක් පිහිටුවීමට ව්‍යාපෘතිය කටයුතු කර තිබුණි. මෙම කාර්යය සඳහා 2016 මාර්තු 29 දින රු.මිලියන 2.4 ක පිරිවැයකට ප්‍රසම්පාදනය කරන ලද දැව, ආරක්ෂක මෙවලම් කට්ටල ආදී විෂයයන්, පුහුණු මධ්‍යස්ථානය පිහිටුවීමට විශේෂිත ස්ථානයක් විශ්වවිද්‍යාලය විසින් වෙන්කර නොතිබූ බැවින් 2017 අප්‍රේල් 30 වන විටත් අනාරක්ෂිත ආකාරයෙන් නිෂ්කාර්යව පැවතුණු බව නිරීක්ෂණය විය.

(ඊ) සබරගමුව විශ්ව විද්‍යාලයේ සංචාරක බංගලාවක් නවීකරණය හා පුළුල් කිරීම සඳහා ව්‍යාපෘතිය විසින් රු.මිලියන 5.69 ක මුදලක් වැයකර තිබුණි. කෙසේ වුවද, 2017 අප්‍රේල් 27 දින සිදු කරන ලද වැඩ බිම් පරීක්ෂාවේදී ඉදිකිරීම් වැඩ විධිමත් ආකාරයෙන් සිදු කර නොතිබූ බවත්, ජනෙල්, ග්‍රිල් හා වායුසමීකරණ යන්ත්‍ර ආදිය විධිමත්ව සවිකර නොතිබූ බවත් නිරීක්ෂණය විය.

**3.3 ව්‍යාපෘතියේ කාර්යයන් අවසන් කිරීම**

**------------------------------------------**

2016 ඔක්තෝබර් 25 දිනට ව්‍යාපෘති කාර්යයන් අවසන් කර තිබුණද, ව්‍යාපෘතිය විසින් ප්‍රසම්පාදනය කරන ලද දේපල, පිරියත හා උපකරණ ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනවලට භාරදීම සඳහා පියවර ගෙන නොතිබුණි. තවද ලෙජර ගිණුම් වසා දැමීමට හා ඒ අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකයට උපදෙස් දීම සඳහා ව්‍යාපෘතියේ ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය විසින් පියවර ගෙන නොතිබුණි.